# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2014 සැප්තැම්බර් මස 23 වන දින පෙ.ව 9.30ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

01. ගරු යූ. ජෝර්ජ් පෙරේරා මන්ත්‍රීතුමා විසින්, ගරු විදුලිබල හා බලශක්ති. පළාත් මාර්ග,නිවාස හා ඉදිකිරීම්, ජලසම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා, වතු යටිතල පහසුකම්, අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/vi (1) / 14 / 35)

(අ) පසුගිය පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසු එම වකවානුව තුළදී පළාත් සභා මාර්ග කොපමණ ප්‍රමාණයක් සංවර්ධනය කර තිබේ ද?

(ආ) එම පළාත් සභා මාර්ග දිස්ත්‍රික් වශයෙන් හා මැතිවරණ කොට්ඨාශ වශයෙන් නම් කළ හැකි ද?

(ඇ) එම වකවානුව තුළදී සංවර්ධනය කළ පාරවල් සඳහා සියළුම මුදල් මේ වන විට ගෙවා නිම කර ඇත් ද?

(ඈ) එම මුදල් කුමන අමාත්‍යාංශ අරමුදලින් ගෙවීම සිදු කර ඇත් ද?

(ඉ) එම වකවානුව තුළදී ගිවිසුම් අත්සන් කර නිම නොකළ පාරවල් තිබේද? එම පාරවල් නම් කළ හැකි ද?

(ඊ) එම පළාත් සභා පාරවල් සංවර්ධන කටයුතු ආරම්භ කිරීමටත් ප්‍රථම අත්තිකාරම් මුදල් ගෙවා ඇත් ද? එම පාරවල් නම් කළ හැකි ද?

02. ගරු සුසිල් කිඳෙල්පිටිය මන්ත්‍රීතුමා විසින්, ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් 2014.09.09 දින අසන ලද ප්‍රශ්ණය; (ප්‍ර/ vi (1) / 14 / 37)

අ. මේ වසර තුළ මෙතෙක් රුපියල් ලක්ෂය බැගින් ලැබූ දහම් පාසල් ගණන කොපමණද?

ආ කොළොන්නාව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ දහම් පාසල් කියකට මෙම මුදල් ලබා දී තිබේද?

ඇ. තවත් දහම් පාසල් කීයකට මෙම ප්‍රතිපාදන ලබා දීමට ඉතිරිව ඇත්ද?

ඈ. එම දහම් පාසල්වලට ප්‍රතිපාදන ලබා දීමට කිසියම් බාධාවක් තිබේද?

ඉ. දහම් පාසල්වලට ප්‍රතිපාදන නිකුත් කිරීම හා අධීක්ෂණය කරනු ලබන්නේ කවුද?

ඊ. කලින් වතාවල සිදු කළ ආකාරයට වඩා වෙනස්ව යමින්, මෙම මුදල් ආධාර බෙදා දීමේ කටයුතු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට බාර දෙන ලෙස නියෝග කරමින් ප්‍රාදේශීය ලේකම්වරුන්ට ඔබතුමා ලිපි යවා තිබේද?

03. ගරු සුසිල් කිඳෙල්පිටිය මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් 2014.09.09 දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර/vi.(1)/14/3?)

අ. ඩෙංගු රෝගය වැලැක්වීමේ ක්‍රියාකාරකම් සඳහා බස්නාහිර පළාත් සභාව, බල ප්‍රදේශයේ පිහිටි පළාත් පාලන ආයතනවලට මුදල් වෙන් කර තිබේද?

ආ. එය කොපමණ මුදලක්ද?

ඇ. එම මුදල් වැය කරමින් ක්‍රියාත්මක වැඩ සටහන් මොනවාද?

ඈ. පළාත් පාලන ආයතනවලට ප්‍රතිපාදන ලබා දීමේදී අදාළ ප්‍රදේශයේ ඩෙංගු තත්ත්වය සැලකිල්ලට ගෙන එම මුදල් වෙන් කළේද?

ඉ. අදාළ පළාත් පාලන ආයතන මුදල් වැය කළ ආකාරය සම්බන්ධයෙන් පසුවිපරම් සිදුකළේද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. සභාවේ රැස්වීම්

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට.

යෝජනාව :

"2015 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය සහ ඊ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන්කල දිනයන් සම්බන්ධයෙන්, මින් පෙර කිනම් තීරණයක් ගෙන තිබුණ ද, ඊ කිසිත් නොතකා, 2014 සැප්තැම්බර් මස 10 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ දී එළඹුණු එකඟතාවයද, සැලකිල්ලට ගෙන, 2014 දෙසැම්බර් මස 02.03.04. හා 05 යන දිනයන් 2015 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය සහ ඊ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයන් විය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය."

## X. සභාවේ කටයුතු

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට,

යෝජනාව :

*"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය"*

## XI. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

**01 . ගරු කිත්සිරි කහටපිටිය මන්ත්‍රීතුමා:**

'මධ්‍යම රජය ජනතාව මත බදු බර පටවා ජනතාව අසීරුතාවයට පත්කර ඇති හෙයින් පළාතේ ආදායමෙන් පළාතේ පුරවැසියන්ට ජීවන වියදම අඩු කර අවශ්‍ය සහන ලබා දීමට කටයුතු කිරීම මැනවි'' යි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි. '

(යෝ / vi (1) / 14 / 04 )

**02 . ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා (බ.ප.)**

'ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ මත්ද්‍රව්‍ය බෙද හැරීමේ මධ්‍යස්ථානයක් ලෙස පත්ව ඇති බවට පොලිස් වාර්තා වලින් හෙලිවන බව මාධ්‍ය තුළින් වාර්තා වී ඇත.

ලෝකයේ යහ පැවැත්මට බරපතල තර්ජනයක් වූ, මත්ද්‍රව්‍ය දිවයිනේ අස්සක් මුල්ලක් නොහැර සීඝ්‍ර ලෙස පැතිර ඇති අතර, පාසැල් දරුවන් ඇතුළු තරුණ පරපුර දිනෙන් දින මීට ඇබ්බැහි වෙමින් පවති. මෙහිදී බරපතල අවදානමකට ලක්ව ඇත්තේ බස්නාහිර පළාතේ ළමා හා තරුණ පරපුරයි.

දකුණු ආසියාවේ විශාලතම මත්කුඩු තොග ශ්‍රී ලංකාවේදී අත්අඩංගුවට ගත්තද, ඒ පිළිබඳව විධිමත් නීතිමය ක්‍රියා මාර්ගයක් නොගැනීම , මෙන්ම වරාය තුළදී බහාලුම් නිසි පරීක්ෂාවකින් තොරව මුදා හැරීම ද ,මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට විශාල අනුබලයක් වී ඇත.

මෙම සියළු තත්වයන්ට රජය වගකිව යුතු අතර, උදාසීනබවින් මිදී දිවයිනේ අති භයානක ලෙස වර්ධනය වී ඇති මත්ද්‍රව්‍ය උවදුර මෙරටින් තුරන් කරලීම සඳහා විධිමත් හා කඩිනම් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන ලෙස, මෙම බස්නාහිර පළතේ පළාත් සභාව රජයෙන් ඉල්ලා සිටියි. '

(යෝ/VI (1) /14/05)

## XII. පොදු කටයුතු

01. ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමා (බ.ප).

"බස්නාහිර පළාතේ 2014 අංක............... දරන මුදල්
(සංශෝධන) ප්‍රඥප්තිය."

( දෙවනවර කියවීම )

[ ප්‍රඥප්ති කෙටුම්පත පළමුවර කියවීම 2014.07.08 දින සිදුකර ඇත ]

## XIII. සභාව කල් තැබීම

කේ.එච්.ඩී. කේ. සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2014.09.10 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.